# නිවාඩුවට අරුතක් - ක්‍රි යාකාරකම්පත්‍රය

සිංහල භාෂාව හා සාහිත්‍යය 9 ශ්‍රේණිය

01) පහත දැක්වෙන කොටස්වල සඳහන් මාතෘකාවලට වචන **250කට** නොඅඩු වන සේ රචනා ලියන්න.

I. අද විශ්වය ගම්මානයක් බවට පත්ව තිබේ. ඒ ගම්මානයට ඇතුළු වීමට මංපෙත් රාශියකි. නමුත් නොදන යන මඟ වරදී. ලොව කොතරම් දියුණුවට පත් වුව ද මේ වන විට ලොව ම ගිල ගන්නා රකුසකු බවට පත්ව ඇති කොරෝනා වෛරසය හමුවේ ලෝක ප්‍රජාව අසරණ වී ඇත. මේ කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් **"කොරෝනා වෛරසයට මුහුණ දෙන ලෝක ප්‍රජාව"** යන මැයෙන් රචනයක් ලියන්න.

II. මල් කැකුළුවන් කුඩා දරුවන්ට වැඩිහිටි ආදරය හා රැකවරණය අත්‍යවශ්‍ය වේ. දරුවන් පෝෂණය කිරීම පමණක් නොව ඔවුන්ට ආරක්ෂාව සැපයීම ද වැඩිහිටි අප සියල්ලන්ගේ ම වගකීමයි. මේ අනුව යමින් **"සුරක්ෂිත ළමා පරපුරක්"** යන මැයෙන් රචනයක් ලියන්න.

02) පහත සඳහන් පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බන්දා විජය දද අකනිට පද හිම්මේ කරුණා මහිම කොයි තරම ද කිවොත් ඔබේ
සින්දා හළ එතෙක් රිපු සිරිලක් අම්මේ මැවුණා මහා ගංගාවන් ලෙසින් ඉබේ
අන්දා ඔබගෙ සිතියම හද මිණි බැම්මේ ඉනුණා බසින දියරක් තැවරුණොත් මොබේ
වැන්දා මෙන්න මුදුනත් නගමින් දැම්මේ මරණාසන්න හුස්මට මුත් ආසි ලැබේ

I.මේ කවි තුළින් කියවෙන්නේ කුමක් පිළිබඳව ද?

II.මෙහි සඳහන් පරිදි මහා ගංගාවන් ලෙසින් මැවුණේ කුමක් ද?

III.ඉහත කවි දෙක තුළ සඳහන් විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න.

IV. ඉහත පැදිවල සඳහන් රූපකයක් ලියා දක්වන්න.

V.පහත සඳහන් පදවල අරුත් ලියන්න.

විජය දද - රිපු - මිණි - ආසි -

03) ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත වෙමින් යන කොරෝනා වෛරසය පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම සඳහා සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න. ඔබ හාපිටිය ප්‍රජා සෞඛ්‍ය ඒකකයේ ලේකම්වරයා යයි සිතන්න.

04) පහත සඳහන් ඡේදයේ අක්ෂර වින්‍යාසය සදොස් තැන් නිදොස් කර, සම්මත ක්‍රමයට පද බෙදා, සුදුසු තැන්වල විරාම ලක්ෂණ යොදා, අකුරුවල හැඩය හා පිරිපුන් බව ගැන සැලකිලිමත් වෙමින් නැවත ලියන්න.

ගෝලීයයා න්ත්‍රන චන්දි කාපද්දතියේ යෙ දවුම්බො හෝය කක්ස ගතකර නලද අනෙ කුත්ව න්දිකා අදීක්ස නය මුහුදුගො ඩබිම්හා ගුවන් ගමන්නියා මන ය අන් තර්ජාල ගනුදෙනුනියා මනයමැ නු ම් හා සිති යම් නිර්මානඉන් කීප යකි

05)I. ඔබ ශ්‍රවණය කළ දේශාභිමානී ගීත **පහක** මුල් පද පේළි ලියා දක්වන්න.

II. ඔබ ශ්‍රවණය කළ මව් ගුණ ගීතයක් සම්පූර්ණයෙන් ලියා දක්වන්න.

III. ඉහත සඳහන් කළ ගීතයේ අන්තර්ගතය පිළිබඳව කෙටි රසාස්වාදයක් ලියන්න.

06) පෙළ පොතේ සඳහන් වන ලේඛකයන් තුන්දෙනෙකු නම් කර ඔවුන්ගේ නිර්මාණ දෙක බැගින් ලියා දක්වන්න.

07) මෙම නිවාඩු කාලයේදී ඔබ කියවූ නවකතාවක්, කෙටි කතාවක් හෝ පරිවර්තන ග්‍රන්ථයක් පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න.